# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2338/21 – 2023 ජුනි මස 27 වැනි අඟහරුවාදා – 2023.06.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2020/19.

**කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.01.07 දිනැති හා අංක 2313/68 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.12.29 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මාතලේ, කවුඩුපැලැල්ල, හයිලෙවල් වත්ත, අංක 90හි පදිංචි එච්. එම්. ඩබ්. අබේරත්න මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.05.03 දිනැති ප්‍රදානය පළ කරනු ලැබූ 2023.06.06 දිනැති හා අංක 2335/08 දරන *ගැසට් නිවේදනය* දෝෂ නිවැරදි කිරීම සඳහා 2023.06.12 දිනැති සංශෝධිත ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ජුනි මස 16 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**2023 ජුනි මස 06 දින 2335/08 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනය**

**දෝෂ නිවැරදි කිරීම**

**බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**

එච්. එම්. ඩබ්. අබේරත්න මයා,
අංක 90,
හයිලෙවල් වත්ත,
කවුඩුපැලැල්ල,
මාතලේ.

(*පළමු පාර්ශ්වය*)

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200,
කිරුළ පාර,
කොළඹ 05.

(*දෙවන පාර්ශ්වය*)

අතර පවතින ආරාවුල

*යොමු අංකය* : IR/COM/03/2020/19.

*නඩු අංකය* : A/01/2023

**ප්‍රදාන පත්‍රයේ දෝෂ නිවැරදි කිරීම**

2023 ජුනි මස 06 වැනි දින ප්‍රසිද්ධ කරන ලද අංක 2335/08 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද උක්ත ආරාවුල පිළිබඳව ප්‍රදානයේ පහත සඳහන් මුද්‍රණ දෝෂ නිවැරදි විය යුතුය.

*ගෙවිය යුතු මුදල ගණන් බැලූ ආකාරය* :

| | |
|---|---|
| එක් වැටුප් වර්ධකයකට හිමි මුදල | රු. 130.00 |
| වැටුප් වර්ධක 03ක් සඳහා | රු. 130 x 3 |
| මසකට අදාළ මුදල | රු. 390.00 |
| හිඟ වැටුප් වර්ධක ගෙවිය යුතු මාස ගණන 2004.05.01 දින සිට 2016.12.31 දක්වා | මාස 152 |
| මසකට රු. 390.00 බැගින් මාස 152 කට හිමි හිඟ වැටුප් මුදල | රු. 390.00 x 152<br>රු. 59,280.00 |

මේ අනුව 2004.05.01 දින සිට 2016.12.31 දක්වා හිඟ වැටුප් වර්ධක මුදල් වශයෙන් රුපියල් පනස් නව දහස් දෙසිය අසූවක මුදලක් (රු.59,280.00) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් හිඟ වැටුප් වර්ධක මුදල් වශයෙන් එච්. එම්. ඩබ්. අබේරත්න මහතාට ගෙවිය යුතු බවට නිගමනය කරමි.

ඉහත සඳහන් රු. 59,280.00 ප්‍රදාන මුදල ප්‍රදානයේ රු. 51,480.00 ලෙස වැරදීමකින් සටහන් වී ඇති සියලුම ස්ථානවල එම ප්‍රදාන මුදල රු. 59,280.00 ලෙස සංශෝධනය විය යුතු බව කාරුණිකව දන්වමි.

තව ද එම ප්‍රදානයේ ඇතුළත් අනෙකුත් කරුණුවල වෙනසක් නොමැති බව වැඩිදුරටත් ප්‍රකාශ කරමි.

ඒ. බී. හේරත්,
බේරුම්කරු.

2023 ජුනි මස 12 වැනි දින,
බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.

EOG 06 – 0209

---

මගේ අංකය: IR/COM/03/2022/51.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.01.30 දිනැති හා අංක 2317/30 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.01.26 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් වත්තල, හැඳල, කෙරවලපිටිය පාර, කරුණාගම, අංක 308/17 හි පදිංචි සී. ජේ. තිලන්ත මයා සහ කොළඹ 01, ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය, නැගෙනහිර කුළුණ, 25 වන මහල හි පිහිටි ඉමර්ජිං මීඩියා (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.05.26 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ජුනි මස 16 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**

යොමු අංකය -IR/COM/03/2022/51

නඩු අංකය -A/21/2023

*පළමු පාර්ශ්වය*
සී. ජේ. නිලන්ත මයා,
අංක 308/17,
කරුණාගම,
කෙරවලපිටිය පාර,
හැඳල, වත්තල.

පෙනී සිටී

*ඉල්ලුම්කරු*

වගඋත්තරකාර පාර්ශ්වයේ ආයතනය වෙනුවෙන් සහකාර කළමනාකාරිණී (මානව සම්පත්) විවේකා සෙව්වන්දි පෙරේරා මහත්මිය සහ නීතිඥ යොහාන් ගමගේ මහතා පෙනී සිටී.

*එදිරිව*

ඉමර්ජින් මීඩියා (ප්‍රයිවට්) ලිමිටඩ්,
25 වන මහල,
නැගෙනහිර කුළුණ,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය,
කොළඹ 01.

වගඋත්තරකරු

**ප්‍රදානය**

ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 සහ (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවන) දරන අණපනත්වලින් සංශෝධිත වූ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ගරු කම්කරු ඇමතිතුමන් වෙත පැවරී ඇති බලතල අනුව, ඉහත පාර්ශ්වයන් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2023.01.23 දින දරන නියෝගයෙන් බේරුම්කරු වශයෙන් මා පත් කර, මා වෙත යොමු කොට ඇත.

*ආරාවුලට හේතු වී ඇති කරුණු :*

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට ඇති උක්ත නියෝග ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගත වී ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය ලෙස කම්කරු කොමසාරිස් ජනරාල් විසින් 2023.01.23 දින එවා ඇති ලිපියේ දක්වෙන්නේ ඉමර්ජින් මීඩියා (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ 2016.02.01 දින සිට 2019.08.23 දින දක්වා විකුණුම් කළමනාකරු ලෙස සේවය කළ සී. ජේ. නිලන්ත මහතා විසින් සිදු කළ විකුණුම් සඳහා ආයතනය විසින් ගෙවිය යුතු කොමිස් මුදලේ හිඟයක් පවතී ද එසේ හිඟයක් පවතී නම් ඔහුට අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහනය කුමක් ද යන්නත් පිළිබඳව වේ.

**පෙනී සිටීම සහ බේරුම්කරණ විභාග පටිපාටිය**

මෙම පරීක්ෂණය 2023.02.14 දින මුල්වරට කැඳවන ලද දිනයේ සිට බේරුම්කරණ විභාගය අවසන් කරන ලද කාලය තුළ සෑම දිනකම දෙපාර්ශ්වය ම පැමිණ සිටින ලදී.

**ඉල්ලුම්කරු මෙසේ ප්‍රකාශ කර සිටී**

මම 2016 සිට 2019 ආයතනයේ වැඩ කළා. 2016 ඉදන් වැඩ කරපු ඒවාට මුදල් ගෙව්වා. නමුත් අස්වෙන මාස 4කට වෙනකම් කොමිස් මුදල් ගෙව්වා. මම අයින් වෙන්න ගියාට පස්සෙත් මට කොමිස් මුදල් ගෙවන බවට Managing Director ජීවා රාජපක්ෂ සහ අධ්‍යක්ෂක ටයිනා ප්‍රනාන්දු යන මහත්වරුන් කියා සිටියා මා සේවයේ යෙදී සිටියදී ගෙවිය යුතු 10% ක කොමිස් මුදල් ගෙවා ඇති බව. මම ආයතනයේ ඉන්නකොටම E-mail එකක් දාලා විස්තර කළාම කිව්වා, ටයිනා ප්‍රනාන්දු මහතා මින්පසු ඔවුන් මාත් එක්ක එකඟතාවයකට කම්කරු දෙපාර්තමේන්තුවේ දී එකග වුනා. ඊට පසු මම ආයතනයට කථා කළා කවදාද ගෙවීම් කරන්නේ කියලා. නමුත් ඒකට පිළිතුරක් ලැබුනේ නැහැ. මම ආයතනයට කියා සිටියා මම වැඩ කරපු කාලයට කොමිස් මුදල් ගෙවන ලෙසටත් අස්වූ පසු ගෙවීමට ඇති කොමිස් මුදල් උවමනා නැති බවත් දෙවන පාර්ශ්වයට දන්වන ලදී. ආයතනය නියෝජනය කිරීම සඳහා කාංචනා විජේසිංහට 2020.10.21 දිනැති ලිපියෙන් කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු කොමසාරිස්ට දී ඇති ලිපියේ සඳහන් කර ඇත. ඒ අනුව 2020.12.01 දින ඇ පෙනී සිට ගෙවීමට ඇති මුදල වන රුපියල් දෙලක්ෂ අනූතුන් දහස් අසූ අටයි ශත හැට නවයයි (රු. 293,088.69) වන බවත් දැන් තත්වය අනුව ආයතනයේ මූල්‍ය තත්වය අනුව එය ගෙවීමට නොහැකි බව කම්කරු දෙපාර්තමේන්තුවේ දී ප්‍රකාශ කරන ලදී.

*නිරීක්ෂණය*

1. දෙවන පාර්ශ්වයේ සාක්කිකාරිය විසින් දී තිබෙන ප්‍රකාශය අනුව ආයතනය විසින් ඉල්ලුම්කරුට ගෙවීමට රුපියල් දෙලක්ෂ අනූතුන් දහස් අසූ අටයි ශත හැට නවයයි (රු. 293,088/69) ඇති බව දන්වා සිටින ලදී. ඉදිරිපත් කරන ලද ලේඛන අනුව.

2. පැමිණිලිකරුට හිමි මුදල වන රුපියල් දෙලක්ෂ අනූතුන් දහස් අසූ අටයි ශත හැට නවයයි (රු. 293,088/69)ක් ගෙවන බවට Managing Director ජීවා රාජපක්ෂ සහ අධ්‍යක්ෂක ටයිනා ප්‍රනාන්දු පොරොන්දු වී ඇතත් ඉදිරිපත් කරන ලද ලේඛන අනුව එය ගෙවා නොමැත.

3. තව ද පළවන පාර්ශ්වකරු විසින් අස් වී ගියපසු ඔහුට ලැබිය යුතු කොමිස් මුදල් ද උවමනා නැති බව සඳහන් කර ඇත.

4. තව ද පළවන පාර්ශ්වයේ ලිඛිත දේශනවලින් දන්වා තිබෙන්නේ පළවන පාර්ශ්වයට හිමි සේවා අර්ථසාධක අරමුදල හා සේවා භාරකාර අරමුදලට ද මුදල් තැන්පත් කර නොමැති බවයි. මෙම පරීක්ෂණය අවසානයේ පෙනී යන්නේ සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදලට ද ගෙවන ලෙසට පහත සඳහන් පරිදි වේ.

*ප්‍රදානය*

1. ඉල්ලුම්කරු විසින් ඉල්ලුම් කරන කොමිස් මුදල වන රුපියල් දෙලක්ෂ අනූතුන් දහස් අසූ අටයි ශත හැට නවයයි (රු. 293,088/69) සහ ඊට හිමි සේ. අ. අරමුදල වන 8% ක් වන රුපියල් විසිතුන් දහස් හාරසිය හතළිස් හතයි ශත නවයයි (රු. 23,447/09) සේවකයාගේ කොටස සහ

සේවා යෝජකයාගේ කොටස යන 12% රුපියල් තිස්පන් දහස් එකසිය හැත්තෑවයි ශත හැටහතරයි (රු. 35,170/64)ක් සහ සේ. භා. අරමුදල 3% වන රුපියල් අට දහස් හත්සිය අනූ දෙකයි ශත හැට හයයි (රු. 8,792/66) මුළු එකතුව රුපියල් තුන්ලක්ෂ හැට දහස් හාරසිය අනූනවයයි ශත අටක් පමණයි (රු. 360,499/08).

2. ඉල්ලුම් කරන මුළු මුදල වන රුපියල් තුන්ලක්ෂ හැට දහස් හාරසිය අනූනවයයි ශත අටක් පමණයි (රු. 360,499/08) ඒ හැර අමතර කිසිදු මුදලක් කිසිම පාර්ශ්වයකට හිමි නොවේ. තව ද බේරුම්කරණයේ විභාගයට සම්බන්ධ ගාස්තු හෝ වෙනත් වියදමක් එක් පාර්ශ්වයකින් තවත් පාර්ශ්වයකට හිමි නොවේ.

3. මෙම ප්‍රදානය අනුව ගෙවිය යුතු සම්පූර්ණ මුදල වන රුපියල් තුන්ලක්ෂ හැට දහස් හාරසිය අනූනවයයි ශත අටක් පමණයි (රු. 360,499/08) මුදලට අමතරව අධිභාරයක් ඇත්නම් එය කොමසාරිස්තුමා විසින් ගණනය කරනු ලැබේ. මෙම මුදල දකුණු කොළඹ කොමසාරිස් කාර්යාලයේ කොමසාරිස් නමින් තැන්පත් කරන ලෙසට මෙයින් නියෝග කරමි. මෙකී මුදල සමථ පොරොන්දුවක් මත දෙපාර්ශ්වයට එකඟතාවය මත මෙම ප්‍රදානය රජයේ *ගැසට් පත්‍රයේ* පළවූ දින සිට දින 30ක් ඇතුළත සමථ පොරොන්දුව මත එම මුදලින් 1/3ක් තැන්පත් කළ යුතුය. එම දින සිට තවත් දින 30කින් ඉතිරි 2/3න් 1/3ක් නැවතත් එම කාර්යාලයේ තැන්පත් කළ යුතුය. ඉන් පසු නැවත දින 30 කට පසුව ඉතිරි 1/3 ක් එම කාර්යාලයේ ම තැන්පත් කළ යුතුය.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බවට ප්‍රකාශ කරමි.

කපිතාන් එම්. ජී. ජී. මෙන්ඩිස්,

බේරුම්කරු.

2023 මැයි මස 26 වැනි දින කාර්මික අධිකරණයේ දී ය.

EOG 06 – 0210